**මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල 12ක් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබූ පොත් 2,276ක වටිනාකම රු.1,041,246ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ වත්කම් ලෙස අනාවරණය කිරිමට ක්‍රියාමාර්ග ගන්නා බව. | සභාව සතු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු.115,900ක් වැයකර ස්ථාපිත කළ ට්‍රැක්ටර් ආවරණය සහ සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු යන්ත්‍රෝපකරණවල වටිනාකම එකතුව රු.281,400ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මුද්‍රණ යන්ත්‍රය සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර ආදිය ඉදිරි වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරිමට ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |
| (ඇ) | ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන ගොඩකිරීමේ ගාස්තු රු.138,070ක් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මෙම දෝෂය නිවැරදි කරන බව. | බැරකම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ වටිනාකම අනාවරනය නොවූ ස්ථාවර වත්කම් 31ක් තක්සේරු කර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී වටිනාකම තක්සේරු කර වත්කම් ලෙස අනාරවණය කිරිමට පියවර ගන්නා බව. | සභාව සතු වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.26,086,209ක් වටිනා ගිණුම් 10කට අදාල ස්ථාවර වත්කම් ලේඛන, හිමිකාරිත්වය තහවුරු කිරීමේ ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් රථ, ගෘහාණ්ඩ ආදියෙහි වටිනාකම තක්සේරු කිරීමට සහ වාහනවල අයිතිය පවරා ගැනිමටත් කටයුතු කරනු ලබන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | **ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | අත්තිකාරම් ගෙවීම් නිරවුල් කිරිමට පියවර ගත යුතුය. |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | සභාව විසින් පසුගිය වර්ෂ 10ක කාලපරිච්ඡේදය තුළ ලබාදුන් තත්කාර්ය අත්තිකාරම් එකතුව රු.1,335,076ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | තොරතුරු නොමැති අත්තිකාරම් ගෙවීම් ගැලපීම් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ උපදෙස් විමසා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි කල් ඉකුත් වූ තැන්පතු 36ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 42,837,658 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,605,386ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල්කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| වරිපනම් හා බදු | 4,875,000 | 7,724,910 | 7,445,980 | 3,436,600 | 3,050,000 | 7,342,800 | 6,689,430 | 3,157,670 |
| කුලී | 18,033,000 | 15,273,841 | 17,867,637 | 4,325,850 | 17,737,000 | 9,085,657 | 17,491,824 | 6,919,645 |
| බලපත්‍ර ගාස්තු | 1,900,000 | 2,774,040 | 2,774,040 | - | 1,825,000 | 2,591,510 | 2,591,510 | - |
| වෙනත් ආදායම් | 4,425,000 | 3,582,737 | 3,614,087 | 1,656,338 | 43,610,000 | 55,040,481 | 55,040,803 | 5,005,689 |
| එකතුව | 29,233,000 | 29,355,528 | 31,701,744 | 9,418,788 | 66,222,000 | 74,060,448 | 81,813,567 | 15,083,004 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු රු. 3,436,600ක් වූ අතර ඉන් රු.3,157,670ක් වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාල පරාසයකට අයත්ව තිබුණි. | හිඟහිටි මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂ අවසානය දක්වා කුලීහිමියන් 12කගෙන් අයකරගත යුතු හිඟහිටි කඩකුලී රු.556,376 ක් පැවැතිණි. | හිඟහිටි මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟ හිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |
| (ii) | 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා බදුකුලීහිමියන් 63කගෙන් අයකරගත යුතු හිඟහිටි බදුකුලී රු.3,629,224ක්ව පැවැතුණි. | 1985-2009 කාල පරිච්ඡේදයේ රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් අයකර නොතිබුණි. එමනිසා මේ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාට වාර්තා කර කපාහැරීමට පියවර ගෙන ඇති බව. | -එම- |
| **(ඇ)** | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.19,877,903ක් සහ රු.18,114,773ක් විය. | ඉදිරි වර්ෂයේ අයකර ගැනීමට පියවර ගන්නා බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10ක සිට මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස ඉදිරිපත් කර තිබූ ලංකා විදුලිබල මණ්ඩලයට ලබාදුන් අත්තිකාරම් රු. 167,580ක් සහ ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.2,069,410ක් සහ වර්ෂ 10කට අධික කාලයක සිට අයනොකර හිඟහිටි වෙනත් ආදායම් ලෙස දක්වා තිබූ රු.1,656,338ක හිඟවිදුලිය ගාස්තු ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟමුදල් ගැලපීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීන අත්තිකාරම්, ගෙවිය යුතු සහ හිඟහිටි වෙනත් ආදායම් ගැලපීමට පියවර ගතයුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි එකතුව 53ක් සහ මෝටර් රථ 27ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරි වර්ෂයේ ක්‍රියාමාර්ග ගන්නා බව. | වත්කම්වල අගය ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සිට 2023 කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පත් 1,286කින් අයදුම්පත් 354ක පැමිණිලි, ඉඩම් ගැටළු, ලිපිලේඛනවල අඩුපාඩු සහ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමාදයන් හේතුවෙන් අනුමැතිය ලබාදී නොතිබුණි. | ඉදිරියේදි මෙම දෝෂ නිවැරදි කරනු ලබන බව. | ගොඩනැගිලි අයදුම්පත් සඳහා අනුමැතිය ප්‍රමාදයකින් තොරව ලබාදීමට පියවර ගතයුතුය. |
| (ආ) | 2019 අප්‍රේල් 17 දිනැති අංක 597/8 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසීන්හි උපවගන්ති 6(11) හා 6(111) ප්‍රකාරව, අනවසර ඉදිකිරීමක් වන පෙරියකල් ආරු මංගල සහ සංස්කෘතික මණ්ඩප ගොඩනැගිල්ල සඳහා දඩගාස්තු රු.459,980ක් අයකර නොතිබුණි. | දඩගාස්තු අයකිරීමට පියවර ගැනීමට නියමිත බව. | හිඟ දඩගාස්තු අයකිරිමට පියවර ගතයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවත්වැඩියා කළහැකි තත්ත්වයේ පවතින වාහන 02ක් අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි තවත් වාහන 03ක් සුදුසු පරිදි අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරිමටත් පියවර ගෙන ඇති බව. | වාහන අළුත්වැඩියා කිරීමට සහ භාවිතා කළ නොහැකි වාහන ඉවත් කිරිමටත් පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව ප්‍රකාරව, සභාවේ පුරප්පාඩු 17ක් පැවැතුණි. | සභාව විසින් තීරණ ගෙන පුරප්පාඩුව පවතින කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ඉල්ලීම් සිදුකළද, කිසිදු ප්‍රගතියක් අත්නොවු බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | විශ්‍රාම ගිය, මියගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන් 06කගෙන් අයවිය යුතු හිඟණය එකතුව රු.601,440ක් අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | මියගිය නිලධාරින්ගේ මාසික විශ්‍රාම වැටුපෙන් අයකරමින් පවතින බව.<br>ආපදා ණය, විශ්‍රාම වැටුපෙනුත්, මරණ පාරිතෝෂිතයෙන් සහ වැටුප්රහිත අයගෙන් අයකිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟණය ශේෂ අය කිරිමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක රෙගුලාසි ප්‍රකාරව ලී මෝල් 08ක්, බේකරි 04ක්, ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් ස්ථානයක් සහ වාහන අළුත්වැඩියා ස්ථානයක් ආදියෙහි කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර අළුත්කිරීමට පසුගිය වර්ෂ 03ක කාලයක් පියවර ගෙන නොතිබුණි. | අදාල ව්‍යාපාරික ස්ථානයන්හි බලපත්‍ර අළුත් කිරීමට පියවර ගනු ලබන බව. | පාරිසරික බලපත්‍ර නියමිත පරිදි අළුත් කිරිමට පියවර ගත යුතුය. |